# මනස විසින් මනස මනස ලෙස ගනු ලැබීම

අපි නැවතත් අපේ ප්‍රශ්නය කුමක් දැයි කෙටියෙන් සටහන්කරගනිමු. එක් අතකින් ගත්කල අප සූදානම්වන්නේ අනිත්‍ය හා අනාත්ම යන්න බුද්ධියෙන් (මනසින්) අවබෝධකරගැනීමට ය. චිත්තය, පුටුව ආදිය අප යොදාගන්නේ ඉන් කියැවෙන්නේ කුමක් ද පිළිබඳ බුද්ධිමය ආකෘති ගොඩනගාගැනීමට ය. අනිත්‍ය අනාත්ම යන්න බුද්ධියෙන් සංකල්පීය ව අවබෝධකරගැනීම නිවනට මගක් නො වෙයි. නිවන් අවබෝධකරගැනීමට සංකල්ප පසෙකට දැමිය යුතු වෙයි. කෙසේ වෙතත් අපේ අරමුණ මනසට මනස ඔස්සේ ම ආකෘතියක් ගොඩනගාගැනීමට ය. එනම් මනස පිළිබඳ ආකෘතියක් මනසින් ම නිර්මාණයකිරීමට ය. එහි දී අපට චිත්තය යන්න අවශ්‍ය වෙයි. චිත්තය ද මනසින් නිර්මාණය කෙරෙන්නක් වෙයි. චිත්තය පිළිබඳ සංකල්පය මනසින් නිර්මාණය කිරීමේ දී චිත්තයක පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය මතුවෙයි. චිත්තයක් පවතින්නේ යැයි ගැනීමට සෞත්‍රාන්තිකයෝ මැළිවූහ. එහෙත් චිත්තයක පැවැත්මක් ගැන කතා නොකර චිත්තයෙහි ඵළ විපාක ගැන සඳහන් කළහැකි නො වෙයි. එබැවින් හෝ වෙනත් කරුණක් නිසා හෝ ථෙරවාදීහු චිත්තයක පැවැත්ම පිළිගත්හ. ඒ සමග ථෙරවාදීන්ගේ මහගු නිර්මාණ වූ චිත්ත, චෛතසික, රූප, නිවන පිළිබඳ ධර්මවාදය ද, ක්‍ෂණවාදය ද බිහිවිණි. කාලය පඤ්ඤත්තියක් ය යන අදහස ද, වෙනස්වීම ගැන නව අර්ථකථනය ද, පැවැත්ම පිළිබඳ ගැටළුව ආශ්‍රිත ව ථෙරවාදීන් විසින් නිර්මාණයකෙරිණි.

පුටුවක පැවැත්ම මෙන් ම චිත්තයක පැවැත්ම පිළිබඳව ද කතාකිරීම ආත්මවාදී වෙයි. එහි පුද්ගලාත්මවාදයක් නො තිබුණ ද ධර්මාත්මවාදයක් වෙයි. ථෙරවාදී නොවන වෙනත් බෞද්ධ ගුරුකුලවලට ප්‍රශ්නයක් වූයේ මේ ධර්මාත්මවාදය ය. නාගර්ජුන හාමුදුරුවන් විසින් බිහිකරන ලද මාධ්‍යමික නමින් හැඳින්වෙන පසුව මහායාන නිකායක් බවට පත් වූ ගුරුකුලය ධර්මාත්මවාදය ප්‍රතික්‍ෂෙප කෙළේ ය. නාගර්ජුනපාදයන් වහන්සේ විසින් ශූන්‍යතාව නම් සංකල්ප බිහිකෙරුණේ චිත්තයක හෝ පුටුවක හෝ පැවැත්ම, ඒවාහි අවස්ථායිභාවය, ප්‍රතික්‍ෂෙපකිරීමෙන් ය. එහෙත් ශූන්‍යතාවය සංකල්පයක් වීමත් සමග එයට ද පැවැත්මක් අත්විය. ඒ සමග උන්වහන්සේ අතින් නිවන, සංසාරයට සාපේක්‍ෂ ව ගැනීමෙන් නිවන ද සංකල්පයක් බවට පත්කෙරිණි. නිවන සංකල්පයක් නම් එය මනසින් අවබෝධකිරීමට හැකිවිය යුතු ය. එහි ප්‍රතිඵලය වන්නේ නිවන් අවබෝධයෙන් පසුව ද මනසක් ඉතිරිවීම ය. ඒ මනස ධර්මකාය ආදී වශයෙන් විවිධ වෙස්ගැනීමෙන් පසුව එය සදාකාලික දෙයක් බවට පත්විණි. චිත්තයක පැවැත්ම ප්‍රශ්නකළ මාධ්‍යමිකයන්ට සදාකාලික ව පවත්නා මනසක් නිර්මාණයකිරීමට සිදුවිය.

අපේ ප්‍රශ්නය වනුයේ ශූන්‍යතාව යන සංකල්පය නැතිව පැවැත්ම යන්න ගැන මනසින් ආකෘතියක් තනාගැනීම ය. මේ ආකෘතිය පසුව අපට ක්වොන්ටම් භෞතිකයේ ද යොදාගැනීමට හැකිවනු ඇත. අපේ ප්‍රවාදවලට එහි වැදගත්කමක් ඇත. චිත්තයක් යනු මනසින් ගතහැකි කුඩා ම සංකල්පය මිස මනසින් තොරව පවත්නා ධර්මයක් නො වෙයි. ථෙරවාදීන් විවේචනයකළ වෙනත් බෞද්ධයනට අවබෝධකරගත නොහැකිවූයේ මේ කරුණ ය. එහෙත් ථෙරවාදීනට ද තම විවේචකයන්ට පිළිතුරු දීම සඳහා චිත්ත හා රූප යනු මනස විසින් මනසට සාපේක්‍ෂව පිළිවෙළින් අනෙක් ඉන්ද්‍රියන්ගේ සහාය නැතිව හා සහාය ඇතිව නිර්මාණය කෙරෙන කුඩා ම (සියුම්) ධර්ම ලෙස සූත්‍රගතකිරීමට නො හැකිවිය. මේ හේතුවෙන් ථෙරවාදීන්ගේ ධර්මවාදය යනු ධර්මය යථාර්ථයක් ලෙස පවතින ධර්මාත්මවාදයක් යැයි කීමට වෙනත් බෞද්ධ ගුරුකුලවලට හැකිවිය.

අප කියාසිටියේ චිත්ත හා රූප යනු මනසට ගතහැකි කුඩා ම ධර්ම බව ය. එහෙත් ඒ ධර්ම ද වෙනස් වෙයි. A නම් චිත්තය යනු P, Q, R ආදී වශයෙන් වූ "ධර්ම" රාශියක අනුක්‍රමයකි. එහෙත් ඒ ධර්ම P, Q, R ආදී වශයෙන් වෙන වෙන ම ගැනීමට මනසට නො හැකි ය. ඒ මනස එතරම් සියුම් නොමැති බැවින් ය. මෙහි දී කිවයුතු කරුණක් වනුයේ එසේ P, Q, R ආදී වශයෙන් ගැනීම වුව ද වැරදි බව ය. අප එවැනි ආකෘතියක් නිර්මාණය කරන්නේ අපට කළහැකි වෙන දෙයක් නොමැති බැවින් ය. අපට අනිත්‍ය අනාත්ම, සංකල්ප නොවන ආකාරයකට ගැනීමට නොහැකි බැවින් අපි එලෙස අනුක්‍රම ගොඩනගමු. දැන් A නම් චිත්තයට පමණක් නොව B නම් පුටුවට ද, C නම් මේසයට ද මේ අනුක්‍රම ආකෘතිය තනාගත හැකි ය. B නම් පුටුව (රූපය) L, M, N ආදී වශයෙන් වූ ධර්ම අනුක්‍රමයක් ලෙස ද C නම් මේසය X, Y, Z ආදී වශයෙන් වූ ධර්ම අනුක්‍රමයක් ලෙස ද ගතහැකි වෙයි.

© Prof. Nalin De Silva

L ඇතිවී පැවතී නැතිවෙයි. එසේ නැතිවන්නේ M ඇතිවීමෙන් ය. M ඇතිවී පැවතී නැතිවන්නේ N ඇතිවීමෙන් ය. මේ ඇති වී නැතිවීමේ අනුක්‍රමය අපි මහාවිහාර භික්ෂූන් වහන්සේ අනුව යමින්, එහෙත් තරමක් වෙනස් ව, B ලෙස හඳුනාගනිමු. මහාවිහාර භික්ෂූන් වහන්සේ කියා සිටියේ B ආදී වශයෙන් ඇතිවන විවිධ රූප අප විසින් පුටුව ලෙස හඳුනාගැනෙන බව ය. මහාවිහාර භික්ෂූන් වහන්සේට අනුව B නම් රූපය ඇති වී පැවතී නැතිවී වෙනත් රූපයක් ඇතිවෙයි. උන්වහන්සේ කියා සිටියේ එකිනෙකින් වෙනස්වූ ඒ රූප අප විසින් එක ම පුටුවක් ලෙස හඳුනාගැනෙන බව ය. දැන් එලෙස B රූපය ද වෙනස්වන බැවින් නැතිවන්නේ ඇතිවූ B යැයි කිවහැකි නො වෙයි. අප විසින් කෙරී ඇත්තේ B ද වෙනස්වන බැවින් එය ද ඊටත් වඩා සුළු කාලයක් පවතින L, M, N ආදී රූප මගින් විස්තරකිරීම ය. එහෙත් මනස එතරම් සියුම් නොවන බැවින් මේ L, M, N ආදී රූප මනසට ගතහැකි නො වෙයි. L, M, N ආදී රූප ද එයටත් වඩා සියුම් රූප මගින් විස්තර කළහැකි වෙයි. කලින් ද කියා ඇති පරිදි මෙලෙස කුඩා රූපවලට කැඩීම දිගින් දිගට ම කළහැකි වෙයි. අප සංකල්පීය ලෙස පුටුව හා එහි වෙනස්වීම තේරුම්ගැනීමට යෑමේ දී අපට එවැනි ක්‍රියාවලියක් අනුගමනය කිරීමට සිදුවෙයි.

B ආදී වශයෙන් රූප ගත්ත ද, L, M, N ආදී වශයෙන් මනසට ගෝචර නොවන කුඩා රූප වශයෙන් ගත්ත ද, අපට ඕනෑම රූපයක් ඇති වී පැවතී නැතිවන්නේ යැයි ගැනීමට සිදුවෙයි. මේ රූප අනුක්‍රම අපට පුටුවක්, මේසයක් ආදී වශයෙන් යම් වස්තුවක් ලෙස ගැනීමට හැකිවන්නේ ඇයි? L, M, N ආදී වශයෙන් වූ රූප X, Y, Z ආදී වශයෙන් වූ රූප සමග මිශ්‍ර නොවන්නේ ඇයි? මේ ප්‍රශ්නයට  අපට පිළිතුරක් ඇත. L නම් රූපය ඇති වී පවතින කාලය තුළ එය එහි ඇති යම් තොරතුරු නැතිකර වෙනත් තොරතුරු එකතුකර ගනියි. එය නැතිවන්නේ එහි එවිට වූ තොරතුරු M රූපයට ලබාදෙමින් ය. එනම් M රූපය ඇතිවන්නේ L රූපයෙන් එහි වූ තොරතුරු ලබාගෙන ය. මෙහි දී වැදගත්වන්නේ තොරතුරු හෙවත් විඥාපන ය.

අනුක්‍රමයක එක් සාමාජිකයකුගෙන් අනුගාමී සාමාජිකයාට විඥාපන ලබාදීම රූප සම්බන්ධයෙන් පමණක් නොව චිත්තවලට ද වලංගුවෙයි. එක් චිත්තයක් ඇතිවී පැවතී නැතිවන්නේ ඒ චිත්තයෙහි විඥාපන අනුගාමී චිත්තයට ලබාදීමෙන් ය. මෙහි දී කිවයුතු කරුණක් වනුයේ එක් චිත්තයක්, එය අභිධර්මයෙහි සඳහන්වන මනසට ග්‍රහණය කරගත හැකි චිත්තය වුව ද, නැත්නම් එවැනි චිත්තයක කොටස් වශයෙන් සැලකිය හැකි මනසට හසුනොවන කුඩා චිත්තයක් වුව ද, වෙනස් වන බව ය. නැතිවන්නේ ඇතිවූ චිත්තය නො වෙයි. එහෙත් මෙලෙස චිත්ත කුඩා චිත්තවලට කැඩීමෙහි කෙළවරක් නොමැති හෙයින් මනසට හසුවන කුඩා ම චිත්තයෙන් ථෙරවාදී අභිධර්මයෙහි ඒ දිගින් දිගට කැඩීම නවතා ඇතැයි සිතිය හැකි ය.

ථෙරවාදී අභිධර්මයෙහි සඳහන්වන චිත්තය පවතින්නේ යැයි ගැනීමෙන් ථෙරවාදීන් ධර්මාත්මවාදීන් වී ඇතැයි පැවසෙන්නේ මේ චිත්තය වෙනස්වන චිත්තයක් ලෙස නොගැනීම නිසා නොව ධර්මවාදයෙහි ඒ චිත්තය යථාර්ථයක් (reality) ලෙස ගැනීම නිසා ය. වෙනස්වීම පිටුපස ආත්මීයභාවයක්, අවස්ථායිභාවයක් ගම්‍යවන්නේ චිත්තය යථාර්ථයක් බවට පත්කිරීම හේතුවෙන් ය. අප කළ යුත්තේ මහාවිහාර භික්ෂූන් වහන්සේ අනුව යමින් මේ චිත්තය ද චිත්ත අනුක්‍රමයක් ලෙස ගැනීම ය. ඒ අනුක්‍රමයෙහි චිත්ත මනසට හසුවන්නේ ද නැත් ද යන්න ප්‍රශ්නයක් නොකරගත යුතු ය. එසේ චිත්ත අනුක්‍රමයක් ලෙස ගැනීමෙන් අභිධර්මයෙහි සඳහන් චිත්තය වෙනස්වන්නේ ය යන්නට මහාවිහාරික භික්ෂූන් වහන්සේ වෙනස්වීම යන්නට දුන් අර්ථකථනය යොදාගනිමින් නැතිවූයේ ඇතිවූ චිත්තය නොවේ යැයි කිවහැකි ය. එසේ වුව ද ඒ චිත්ත අනුක්‍රමය එකිනෙකට ඈදී ඇත්තේ එක් චිත්තයක් අනුගාමී චිත්තයට විඥාපන ලබාදීම හේතුවෙන් ය. චිත්තවල වෙනස්වීම ඒ අයුරින් තේරුම්ගත්විට හා ථෙරවාදී අභිධර්මයෙහි කියැවෙන චිත්තයක් යනු මනසට සාපේක්ෂව මනසට ගතහැකි කුඩා ම චිත්තය යැයි ගත්විට ථෙරවාදයට තවදුරටත් ධර්මාත්මවාදයක් ය යනුවෙන් චෝදනාකිරීමට මාධ්‍යමිකයන්ට හා අනෙක් මහායානිකයනට මෙන් ම වෙනත් බෞද්ධ ගුරුකුලවලට ද අවස්ථාවක් නො ලැබෙයි.

එක් චිත්තයක් අනුගාමී චිත්තයට විඥාපන ලබාදීමේ ප්‍රතිඵලය වන්නේ එක් චිත්ත අනුක්‍රමයක් අනෙක් චිත්ත අනුක්‍රමයකින් වෙන්වීම ය. චිත්ත අනුක්‍රම දෙකක හෝ වැඩි ගණනක හෝ සාමාජික චිත්ත එකිනෙක සමග මිශ්‍ර නො වෙයි. එයට හේතුව ඒ ඒ අනුක්‍රම අතරින් ගලා යන විඥාපන වෙනස්වීම ය. එක් අනුක්‍රමයක චිත්තයක් අනෙක් අනුක්‍රමයක චිත්තයකින් විඥාපන ලබාගැනීමක් නො සිදුවෙයි. මෙයින් කියැවෙන්නේ එක් චිත්ත අනුක්‍රමයක විඥාපන

© Prof. Nalin De Silva

නො වෙනස් ව ගලායන බවක් නො වෙයි. විඥාපන ද වෙනස් වෙයි. එසේ වන්නේ එක් චිත්තයක් ඇතිවී නැතිවන්නේ විඥාපන අඩුකරගැනීමෙන් හා එකතුකරගැනීමෙන් නිසා ය. එහි ප්‍රතිඵලය නම් චිත්තයක් අනුගාමී චිත්තයට ලබාදෙන විඥාපන එය එහි පූර්වගාමී චිත්තයෙන් ලබාගත් විඥාපන නො වීම ය.

අනුක්‍රමයක ගලායන විඥාපන දිගින් දිගට ම එකම නොවුව ද විඥාපන විශාල ප්‍රමාණයක් එක් චිත්තයකින් අනුගාමී චිත්තයට ලැබීමේ ප්‍රතිඵලය වනුයේ ඒ අනුක්‍රමයට යම් අනන්‍යතාවයක් ලැබීම ය. චිත්ත අනුක්‍රමය ඔස්සේ එලෙස යම් ප්‍රමාණයක විඥාපන යම් දුරකට ගලායෑමේ ප්‍රතිඵලය ලෙස චිත්තවල එකතුව, එසේත් නැත්නම් චිත්ත අනුක්‍රමය, නො නැසී පැවැත්වෙන මනසක්, මමත්වයක්, මම ය මාගේ ය යන හැඟීමක් අත්කර ගනියි. මනස යනු මේ චිත්ත අනුක්‍රමය එකක් ලෙස සැලකීමෙන් ලැබෙන ප්‍රතිඵලය වෙයි. පුද්ගලයකු, ආත්මයක් පිළිබඳ හැඟීමක් ලැබෙන්නේ ද මනස ඇතිවීම හේතුකොටගෙන ය. අපි සාමාන්‍යයෙන් පුද්ගලයා යනු චිත්ත පරම්පරාවක් පමණක් යැයි කියමු. ඒ කීම පිටුපස ඇත්තේ මේ චිත්ත අනුක්‍රමය වෙනස්වූ චිත්ත ලෙස නොව එක් මනසක් ලෙස ගැනීම ය. මනසෙහි, ආත්මයෙහි උපත සිදුවන්නේ එලෙස ය. එහෙත් දැන් ප්‍රශ්නයක් ඇතිවෙයි. චිත්ත අනුක්‍රමයක් එලෙස මනසක් ලෙස ගන්නේ කවු ද? කුමකින් ද? එයට ඇත්තේ එක් පිළිතුරකි. චිත්ත පරම්පරාව මනසක් ලෙස ගනු ලබන්නේ මනස විසින් ම ය. මනස මනස ලෙස ගැනෙන්නේ මනස විසින් ම ය! මෙය චක්‍රීය චින්තනයක ප්‍රතිඵලයක් බව පැහැදිලි ය. අපට චක්‍රීය චින්තනයෙන් ගැලවිය නො හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva